# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1906/49 – 2015 මාර්තු 20 වැනි සිකුරාදා – 2015.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩමේ පරවශතාවය පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

එකී පරවශතාවය අත්කර ගනු ලබන්නේ මාතර කතරගම දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අහිමි වූ ප්‍රවේශ මාර්ග ලබාදීමට ඉඩම් අත්කර ගැනීම සඳහාය.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව බටහිර සුළු කොට්ඨාසයේ, නාඔටුන්න ගමේ පිහිටි මාතර මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ඩීවීඑන්/2013/788 සහ 2014.03.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0088 ක් පමණ වූ ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – මද්දුමලියනගෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0088 ක් පමණ

උතුරට: මාතර කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති මද්දුමලියනගෙවත්ත සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ කැලිදුව විදාන ගමගේ පියදාස හිමිකම් කියන මද්දුමලියනගෙවත්ත; දකුණට: කැලිදුව විදාන ගමගේ පියදාස හිමිකම් කියන මද්දුමලියනගෙවත්ත; බටහිරට: සෝමසිරි මඩවල ගමගේ හිමිකම් කියන මහගෙදරවත්ත සහ මාතර කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති මද්දුමලියනගෙවත්ත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංක: 4/3/11/2013/එන්ආර්ඩී/614.
2014 ඔක්තෝබර් මස 31 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04 – 197